www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආර්ථික "පුනර්ජීවනය" ගැන ඔබාමාගේ තැරැව් කිරීම

## Obama touts economic "recovery"

**2009 අගෝස්තු 03**

පසුබෑම අවසන්වී ආර්ථිකය "ගොඩඑමින්" තිබෙන බවට මතියක් ගොඩනැගීම සඳහා ඔබාමා පරිපාලනය හා මාධ්‍ය, දෙවැනි කාර්තුවේ දල දේශීය නිෂ්පාදිතයෙහි (දදේනි) දත්ත අල්ලා ගෙන තිබේ. "පසුබෑම අවසන්ය" යන මුල් සිරස් තලය යොදා ගනිමින් සරසා තිබූ නිව්ස් වීක් සඟරාවේ නවතම සංස්කරනයේ මුල් පිටුවෙන් මෙම උත්සාහය කුලුගැන්විනි.

පසුබෑම අවසානයකට පත්වෙමින් තිබෙන්නේය යන ප්‍රකාශ, දොට්ට දැමීම්, වැටුප් කප්පාදුව, නිවාස වෙන්දේසි කිරීම හා අත්‍යවශ්‍ය සමාජ සේවා කපාහැරීම මඟින් ව්‍යසනයකට මුහුනපා සිටින කම්කරුවන් සඳහා මොනම සැලකිය යුතු සහනයක් හෝ ප්‍රතික්ෂේප කිරීම සඳහා මෙන්ම, බැංකු වලට ඇප දීම සඳහා ඩොලර් ට්‍රිලියන ගනනින් ගෙවා දැමීම වෙනුවෙන්, සෞඛ්‍ය හා සමාජ රක්ෂන වැනි සමාජ වැඩ සටහන් වලට පෙර නොවූ විරූ ආකාරයට පහර දීම සඳහා වේදිකාව සකස්කර ගැනීමට යොදාගනිමින් තිබේ.

වානිජ්‍ය දෙපාර්තමේන්තුව සිකුරාදා වාර්තා කලේ අර්ථශාස්ත්‍රඥයන් විසින් අනාවැකි පලකොට තිබුනු සියයට 1.5 කට වඩා අඩු සියයට 1 කින් පමනක් දදේනි පහත වැටී ඇති බවයි. මෙය සලකුනු කරන්නේ දදේනි එක දිගට සිව්වැනි කාර්තුවටත් පිරිහී යාමයි. වත්මන් පසුබෑම, 1940 ගනන් වලට පසු ඇතිවූ දීර්ඝතම එක ලෙස සටහන් කරයි.

2009 පලමු කාර්තුව සඳහා වෙලඳ දෙපාර්තමේන්තුව මුලින් ඇස්තමේන්තු ගත කල දදේනි වැටීම, සියයට 5.5 සිට සියයට 6.4 දක්වා තියුනු ලෙස පහතට නැඹුරුවන පරිදි සංශෝධනය කර ඇත. 2008 මුලු වර්ෂයට ම එය සියයට 1.1 ධනාත්මක අගයක සිට සියයට 0.4 ක රින අගයකට සංශෝධනය කර තිබේ.

පලමු කාර්තුවේ ආර්ථික කඩා වැටීමේ වේගය දැන් අඩුවී ඇතත්, අප්‍රේල් සිට ජූලි දක්වා ගොඩනැගිලි, උපකරන හා මෘදුකාංග වලට කරන වියදම් ව්‍යාපාරිකයන් විසින් කපාහැර තිබේ. එය තව තවත් දොට්ට දැමීම් හා විරැකියාව ඉහල යාම පිලිබඳ පෙර නිමිත්තකි.

තව දුරටත් එය පෙන්නුම් කරන්නේ, සාමාන්‍ය ඇමරිකානුවන් කෙරෙහි ආර්ථික අර්බුදයේ බලපෑම ගැඹුරු වීමයි. පුද්ගලික පාරිභෝගික වියදම්, කාර්තුව තුල සියයට 1.2 කින් පහත වැටුනු අතර එය අපේක්ෂිත අනුපාතය මෙන් දෙගුනයකි. කල් පවතින භාන්ඩ මිලට ගැනීම් සියයට 2.5 කින් පහත ගියේය.

ජනගහනයේ තව තවත් කොටස් අතරට දුප්පත්කම පැතිර යන ආකාරය පෙන්වන එක් දර්ශකයක් අගෝස්තු දෙවන දින *නිව් යෝර්ක් ටයිම්ස්* වාර්තාවකින් පෙන්නුම් කරයි. දොට්ට දමනු ලැබූ කම්කරුවන් ලක්ෂ ගනනක් දැනටමත් සතියකට ඩොලර් 300 ක සාමාන්‍යයකින් යුත් තමන්ගේ සොච්චම් විරැකියා සහන වලින් හෙම්බත්ව සිටින අතර, ලබන මාසය අවසන් වන විට එය පන්ලක්ෂයක් දක්වාත් වසර අවසන් වන විට 15 ලක්ෂය දක්වාත් ඉහල නඟිනු ඇත.

කෙසේ වුවත් ඔබාමා අගෝස්තු දෙවන දින පැවැත්වූ සිය සතිපතා කථාවේ දී, දදේනි සංඛ්‍යා ලේඛන ඔහුගේ ආර්ථික ප්‍රතිපත්ති සනාථවීමක් ලෙස හුවා දැක්වීය. සිය උත්තේජක වැඩ සටහන හා ඔහුගේ "අනෙකුත් දුෂ්කර නමුත් අත්‍යවශ්‍ය පියවරයන්, පසුබෑමට තිරිංග දමා ඇති බව" ඔහු පැවසීය.

"වගකිවයුතු නිවාස හිමියන්ට සිය නිවාස වල රැඳී සිටීමට හා සිය උකස් නය ගෙවා දැමීමට හැකිවන පරිදි, නිවාස වෙන්දේසියේ දැමීම් පැතිර යාම වැලැක්වීමටත්, නය වෙලඳපොලවල් සමාලෝචනය කර පවුල්වලට හා කුඩා ව්‍යාපාරයන් සඳහා ඒවා විවෘත කිරීමට ආධාර කිරීම සඳහාත්, අප පෙර නොවූ විරූ පරිදි කටයුතු කර ඇත්තෙමු. අප යථා තත්ත්වයට ගෙනඒමේ පනතක් නීතිගතකර ඇති අතර ඒ අනුව, ගුරුවරුන් හා පොලිස් නිලධාරීන් දොට්ට දැමීම වැලැක්වීම සඳහා දුෂ්කරතාවන්ට මුහුනපා ඇති ප්‍රාන්තවලට සහන ප්‍රධානය කිරීම හා මාර්ග, පාලම්, පාසැල් හා රෝහල් යලි ඉදිකිරීම හා නවීකරන කටයුතු වලට මිනිසුන් යොදවන ආයෝජන පහසුකම් ද සලසා ඇත."

ඔබාමා කථාකරන්නේ කුමන රටක් ගැන දැයි යමෙකුට ප්‍රශ්නයක් පැන නැගිය හැක. ප්‍රාන්ත හා

නාගරික ආන්ඩු, නූතන ඉතිහාසයේ අතිශය බාධාකාරී අයවැය හිඟයන් පියවාගැනීම සඳහා රැකියා හා සමාජ වැඩ සටහන් කපාහරිමින් සිටියි. මේ සතියේ නිකුත් කල නව දත්ත වලට අනුව ඇප ලබාගත් බැංකු, වසර ආරම්භයේදීටත් වඩා දැන් පාරිභෝගික නය සීමාකර ඇති බව හා මුදල් ගොඩගසමින් සිටින බව හෙලිවී තිබේ. "වගකිවයුතු" නිවාස හිමියන්ට උදව් කිරීමේ කාරනය සැලකිල්ලට ගත් කල්හි, මෙම වසරේ මුල් හය මාසය තුල නිවාස වෙන්දේසියේ දැමීම් වාර්තාගත මිලියන 1.5 කට නැගී ඇත.

ඔබාමා පෙන්වාදුන් සාර්ථක යයි සලකන ඔහුගේ ප්‍රතිපත්තීන් පිලිබඳ කාරනය ගැන කෙසේ ද? කම්කරුවන්ගේ සෞඛ්‍ය පහසුකම් පිලිබඳව ව්‍යාපාරවලට ඇති බැඳීමෙන් ඒවා මුදාහැරීමට ඔහු ගත් පියවර හා කිසිදු පැකිලීමකින් තොරව ලාභ පද්ධතියට ඔහුගෙන් ලැබෙන සහයෝගය සනාථ කරනු ලැබ ඇත. ඔහුගේ සෞඛ්‍ය පහසුකම් පිලිබඳ යෝජනාවලියේ යටි අරමුන වන මෙය වඩාත් පැහැදිලි වූයේ "අහස උසට නගින රක්ෂන වියදම් වල හිරවීමකින් තොරව ව්‍යවසායකයින්ට අලුත් විදිහකට කටයුතු කිරීමටත්, ව්‍යාපාරයන්ට තරග කිරීමටත් හැකියාව ගෙන දෙන සෞඛ්‍ය පහසුකම් ක්‍රමයක්" සඳහා කල ඔහුගේ කැඳවුමෙන්ය.

ඉරිදා රූපවාහිනී සංවාද මන්ඩපවලට සහභාගී වූ පරිපාලනයේ ආර්ථික කටයුතු පිලිබඳ ඉහල නිලධාරීන් විසින් මෙම තේමාවන් උද්දීපනය කර තිබේ. ධවල මන්දිරයේ ජාතික ආර්ථික කමිටුවෙහි අධ්‍යක්ෂ ලෝරන්ස් සමර්ස් එන්බීසී හි "මාධ්‍යය හමුවන්න" හා සීබීඑස් හි "ජාතියට මුහුන දෙන්න" යන වැඩ සටහන් දෙකෙහිත්, භාන්ඩාගාර ලේකම් තිමෝති ගේත්නර් ඒබීසී හි "ජෝර්ජ් ස්ටෙෆනොපොලෝස් සමඟ මේ සතියේ" වැඩ සටහනෙහි හා ඉන් පසුව එහිම, හිටපු ෆෙඩරල් මහබැංකු සභාපති ඇලන් ග්‍රීන්ස්පෑන් ද පෙනී සිටියහ.

සමර්ස්, ගේත්නර් හා ග්‍රීන්ස්පෑන් යන සියල්ලෝම ආන්ඩුවේ බැංකු මුදා ගැනීමේ සාර්ථකත්වය හුවා දැක්වූහ. පසුව කී දෙදෙන, ජුලි මාසයේ කොටස් වෙලඳපොලෙහි අතිවූ තියුනු නැගීම, පසුබෑම අවසන්වෙමින් තිබෙන බවට සාක්ෂියක් ලෙස ගෙනහැර දැක්වූහ. පරිපාලනයේ පිලිවෙත, "පුද්ගලික අංශය මූලිකත්වය ගත් ගොඩඒමක්" බව අවධාරනය කරමින් ගේත්නර්, ව්‍යාපාරික ප්‍රභුව සැනසීමට උත්සාහ කලේය.

සෙනසුරාදා පැවැත්වූ ඔබාමාගේ දේශනයෙන් හෝ ඉරිදා සංවාද මන්ඩප තුල ඔහුගේ ආර්ථික නිලධාරීන් හෝ, පසුගිය වසරේ ආන්ඩුවෙන් ඒකාබද්ධව ඩොලර් බිලියන 175 ක් ලබාගත් ප්‍රමුඛ පෙලේ බැංකු 9 ක් බෝනස් වශයෙන් බිලියන 33 ක් පමන ගෙවා ඇති බව පෙන්වා දෙමින් නිව් යෝර්ක් හි නීතිපති ඇන්ඩෲ කියුමෝ විසින් ජුලි 30 වන දින නිකුත් කල වාර්තාව ගැන සඳහන් කලේ නැත.

ඊනියා ගොඩඒමෙහි අර්ථය විරැකියාව සාමාන්‍ය මට්ටම් කරා ලඟාවීමය යන කාරනය පිලිබඳව ඇති බොඳවී ගිය බලාපොරොත්තුවලින් සමර්ස් හා ගේත්නර් අපහසුතාවට මුහුනපෑහ. "මාධ්‍ය හමුවන්න" වැඩ සටහනේ කථාකරමින් සමර්ස් අනතුරු ඇඟවූයේ "රැකියාවන් පිලිබඳ චිත්‍රය බොහෝ කලක් යන තෙක් බැරෑරුම්ව පවතිනු ඇති" බවට හා එනමුදු, දෙවන උත්තේජක වැඩසටහනක් ගැන ආන්ඩුවට සැලැස්මක් නොමැති බවය.

ඒ වෙනුවට ඔහු හා ගේත්නර් යන දෙදෙනාම, "වේදනාකාරී" වුවත් "මධ්‍ය කාලයේදී" සමාජ වියදම් කැපීමේ අවශ්‍යතාවය අවධාරනය කලහ. ඔවුන් පැහැදිලි කලේ ඔබාමාගේ සෞඛ්‍ය පහසුකම් සඳහා වියදම් කැපීමේ තල්ලුව, හුදෙක් ආරම්භය පමනක් බවය.

රට "අපගේ තරමට සරිලන තැනකට ගෙන ඒමේ" අවශ්‍යතාවය මත "ඉතා බරපතල තීන්දු" ගැනීම ගැන කථා කල සමර්ස් "හුදෙක් සෞඛ්‍ය පහසුකම් පමනක් නොව තවත් කරුනු ගනනාවක්" ගැන සඳහන් කලේය. වේගයෙන් ඉහල යන අයවැය හිඟය පිලිබඳව සඳහන් කල ඔහු "සෞඛ්‍ය පහසුකම් දෙස බලන්න, හිමිකම් දෙස බලන්න" යනුවෙන් පැවසීය.

ඊටත් වඩා විවෘතව කථා කරමින් ග්‍රීන්ස්පෑන් "හිඟය පිලිබඳ ගැටලුවේ අරටුව" සෞඛ්‍ය පහසුකම් බව හා ඔබාමාගේ කප්පාදු වැඩ පිලිවෙල "ඇති තරම් දුර ගොස් නැති" බවටත් පැමිනිලි කලේය. "ඉතා වැදගත් අතිරේක පියවර අවශ්‍ය" යයි ඔහු කියා සිටියේය. ස්ටෙෆනෝපෝලුස් උත්තරය කටටම දීමෙන් අනතුරුව ඔහු මෙසේ පැවසීය. "බදු අංශය ගත්කල" ඊට, කම්කරු පන්තියේ කර මත අසමානුපාතිකව පැටවෙන අපගාමී බද්දක් වන "වටිනාකමට එකතු කල (වැට්) බදු සඳහා තමන්ගේ එකඟත්වය හිමිවන" බව පැවසීය.

එවන් ප්‍රකාශ සමාජ ආරක්ෂන වැඩ සටහන් මත පෙර නොවූ විරූ ප්‍රහාර ඇඟවුම් කරන අතර, මහා අවපාතයෙන් පසුව විශ්‍රාමිකයන් සඳහා ෆෙඩරල් වැඩ පිලිවෙලෙහි මූලාධාරය, වොෂින්ටන් පෝස්ට් වෙබ් අඩවියෙහි ජුලි දෙවන දින පලකල ලිපි දෙකකින් අනාවරනය කරයි. "විශ්‍රාමික සහන බලාපොරොත්තු නොවන්න" යන සිරස්තලය සහිත වූ පලමු වැන්න, "සමාජ රක්ෂන සහන කැපීමට මුහුනපා සිටින තත්ත්වය හමුවේ ඇමරිකානු ආන්ඩුව වැඩිමනත් හච්හරනක් නොවනු ඇත" යනුවෙන් කෙරෙන ප්‍රකාශය, සිය විශ්‍රාමික ඉතිරිකිරීම් විනාශ කෙරී අති මිලියන ගනනකට බලපානු ඇත. අනෙක අශුභවාදී ලෙස සිරස්තල ගත කලේ "තුනී භාරකාරත්වයක්, සමාජ ආරක්ෂනයට කිසියම් මූලික අලුත්වැඩියාවක් අවශ්‍ය කෙරෙන්නේ මන් ද?" යනුවෙනි.

මෙම පුද්ගලයන්, එනම් ඔබාමා, ගේත්නර්, සමර්ස් හා ග්‍රීන්ස්පෑන් මෙන්ම සංවාද මන්ඩප මධ්‍යස්ථවාදීන් ද දශ ලක්ෂපතියන් බව සිහියට ගැනීම අවශ්‍ය ය. ඔවුන් කථාකරන "දුෂ්කර තීන්දු" ඔවුන්ගේ ජීවිත වලට අබමල් රේනුවක තරම් වත් බලපෑමක් නොකරයි. ඔබාමාගෙන් පටන් ගෙන, කලින් කථාබහ කරගත් පරිදි ඔවුන් සියල්ලන්ම ප්‍රදර්ශනය කරන නිර්දයභාවයේ හා නොතැකීමේ පූට්ටුව, ඔවුන් සඳහා පමනක් නොව ඔවුන් ආරක්ෂා කරන පාලක පන්තියේ ම ආසක්තයන් තුලින් ගලා එයි. පුලුල් ජනගහනයේ වියදමෙන් ධනවතුන් සඳහා ආර්ථික "පිබිදීමක්" පිලිබඳ ඔවුන්ගේ තැරැච්කිරීම, අනතුරු ඇඟවීමක් ලෙස ගත යුතුය. ඔබාමා පරිපාලනයේ සියලු පිලිවෙත්, රටේ සමාජ හා දේශපාලන ජීවිතය මත තත්වකාරක ආඥාදායකත්වයක් පවත්වාගෙන යන මූල්‍ය ප්‍රභූ පැලැන්තියේ ආසක්තයන් රැකගැනීම කෙරෙහි යොමුව තිබේ. බැංකු කරුවන් විසින් ඇවිලවූ අර්බුදය, වැඩ කරන ජනතාවගේ ජීවන තත්ත්වයන් හා සමාජ කොන්දේසි පහත හෙලීම සඳහටම බලපාන පරිද්දෙන් ක්‍රියාත්මක කිරීම සඳහා දැන් යොදා ගනිමින් තිබේ.

2008 බිඳ වැටීමට පූර්වයෙන් පැවති සොච්චම් සමාජ සහන හා පහත් වැටුප් මට්ටම් කරා ආපසු යාමක් නැත. ඒ වෙනුවට, කම්කරු පන්තිය සූරාකෑම ඉමහත් ලෙස උත්සන්න කිරීම හා ඉතිරිව ඇති අතීත සමාජ සහන සියල්ල වනසා දැමීම මඟින් ධනය පහත සිට ඉහලට යලි යලිත් බෙදා හැරීම සිදුවනු ඇත.

ටොම් එලී හා බැරී ග්‍රේ

© www.wsws.org